ඉමං රජ්ජං, මේ රාජ්‍යය; නප්පහොති, නොපොහොනේය; කතරන්නුඛො ඨානං, කවර නම් ස්ථානයක්; රමණීයනති, සිත් කළුදැයි විචාළේය; මහා රාජ, මහරජතුමනි! දෙවලොකො ඉති, දෙව් ලොව යයි (කීවාහුය); සො, ඒ රජතෙම; චක්‍ක රතනං, චක්‍රරත්නයට; අබ්භුක්කිරිත්‍වා, පැන් ඉස; පරිසාය සද්‍ධිං, පිරිස සමඟ; චාතුම්මහාරාජික දෙවලොකං, චාතුර්මහාරාජික දෙව්ලොවට; අගමාසි, ගියේය. අථ, එකල්හි; චත්තාරො මහාරාජානො, සතර වරම් දෙවියෝ; දීබබමාලාගන්‍ධ හත්‍ථා, දිව මල් සුවඳ ගත් අත් ඇතිව; දෙවගණ පරිවුතා, දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලද්දහු; පච්චුග්ගමනං කත්‍වා, පෙර ගමන් කොට; තං, ඒ මන්ධාතු රජ; ආදය, පිළිගෙන; චාතුම්මහාරාජික දෙවලොකං, චාතුර් මහාරාජික දිව්‍යලෝකයට; ගන්ත්‍වා, ගෙන ගොස්; රජ්ජං, රාජ්‍යය; අදංසු, දුන්නාහුය; පරිසාය පරිවුතස්ස, පිරිස විසින් පිරිවරන ලදුව; තස්මිං, ඒ දිව්‍යලෝකයෙහි; රජ්ජං කාරෙන්තස්ස, රාජ්‍යය කරවන්නා වූ; තස්ස, ඒ රජහට; දීඝො අද්‍ධා, දීර්ඝ කාලයක්; වීතිවත්තො, ඉක්මුණේය; සො, හෙතෙම; තත්‍ථ අපි, එහිද; තණ්හං, කාම තෘෂ්ණාව; පූරෙතුං, පූරණය කරන්ට; අසක්කොන්තො, නොහැකි වන්නේ; උක්කණ්ඨිතාකාරං, කළකිරුණු අයුරක්; දස්සෙසි, දැක්වීය; තතො, ඉක්බිති; චත්තාරො මහාරාජානො, සතරවරම් දෙවි මහරජ දරුවෝ (ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යනුයි); මහාරාජ, මහරජතුමනි! කින්නුඛො, කුමක් නිසා; උක්කණ්ඨිතො අසිඉති, උකටලී වූයෙහි දැයි; පුච්ඡිංසු, විචාළහ; ඉමම්හා දෙව ලොකා, මේ දෙව්ලොවට වඩා; කතරන්නුඛො ඨානං, කවර නම් තැනක්; රමණීයං ඉති, සිත් කළුදැයි විචාළේය; දෙව, දේවයන් වහන්ස! මයං, අපි; පරෙසං, අනුන්ට; උපට්ඨාක මනුස්ස සදිසා, මෙහෙ කරන මිනිසුන් සමාන වෙමු; තාවතිංස දෙව ලොකො, තව්තිසා දෙව්ලොව; ඉතො, මීට වඩා; සත ගුණෙන, සියක් ගුණයෙන්; රමණීයො ඉති, රමණීය යයි කීවාහුය; මන්‍ධාතා, මන්‍ධාතු රජ තෙම; චක්‍කරතනං, චක්‍ර රත්නයට; අබ්භුක්කිරිත්‍වා, පැන් වඩා; අත්තනො, තමාගේ; පරිසාය පරිවුතො, පිරිස විසින් පිරිවරණ ලදුව; තාවතිංසාභිමුඛො, තව්තිසා දිව්‍යලොකයට අභිමුඛව; පායාසි, ගියේය; අථ, එකල්හි; අස්ස, ඔහුට; සක්කො දෙවරාජා, සක්දෙව් රජතෙම; දිබ්බමාලා ගන්‍ධහත්‍ථො, දිවමල් දිව සුවඳ ගත් අත් ඇත්තේ; දෙව ගණ පරිවුතො, දිව්‍ය සමූහයා

විසින් පිරිවරා; පච්චුග්ගමනං කත්වා, පෙර ගමන් කොට; තං, ඒ රජහු; හත්ථෙ, අත; ගහෙත්වා, අල්වාගෙන; මහාරාජ, මහරජ! ඉතො එහි ඉති, මෙහි එනු මැනැවැයි; ආහ, කීයේය.

තතො, ඉන්පසු; දෙවගණ පරිවුතස්ස, දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලදුව; රඤ්ඤො රජහු; ගමන කාලෙ, යන කල්හි; පරිනායක රතනං, පුත්‍රරත්නය තෙම; චක්කරතනං, චක්‍රරත්නය; ආදය, ගෙන; පරිසාය සද්ධිං, පිරිස සමඟ; මනුස්ස පථං, මිනිස් ලොවට; ඔතරිත්වා, බැස; අත්තනො, තමාගේ; සරං, ගෙට; පාවිසි, පිවිසියේය.

6. සක්කො, ශක්‍රතෙම; මන්ධාතුං, මන්ධාතු රජ; සක්ක භවනං, ශක්‍ර භවනයට; නෙත්වා, පමුණුවා; දෙවතා, දෙවතාවෝ, ද්වෙ කොට්ඨාසෙ කත්වා, දෙකොටසක් කොට; අත්තනො, තමාගේ; රජ්ජං, රාජ්‍යය; මජ්ඣෙ, මැදින්; භින්දිත්වා, බිඳ; අදාසි, දුන්නේය; තතො පට්ඨාය, එතැන් පටන්; ද්වෙපි රාජානො, රජවරු දෙදෙනාම; රජ්ජං, (දිව්‍ය) රාජ්‍යය; කාරෙසුං, කරවූහ; එවං, මෙසේ; කාලෙ ගච්ඡන්තෙ, කල් යන කල්හි; සක්කො, ශක්‍රතෙම; සට්ඨීසත-සහස්සාධිකානි, හැටලක්ෂයක් අධික කොට ඇති; තිස්සො ච වස්සකොටියො, තුන් කෙළක් අවුරුදු; ආයුං, ආයුෂ; ඛෙපෙත්වා, ගෙවා; චවි, චුත විය; අඤ්ඤො සක්කො, අතික් ශක්‍ර දිව්‍යරාජයෙක්; නිබ්බත්ති, උපන්නේය; සො අපි, ඒ ශක්‍රතෙමේ ද; තථා එව, එසේම; දෙව රජ්ජං, දිව්‍ය රාජ්‍යය; කාරෙත්වා, කරවා; ආයුක්ඛයෙන, ආයු ගෙවීමෙන්: චවි, චුත විය; එතෙන උපායෙන, මේ ක්‍රමයෙන්; ඡත්තිංස සක්කා, ශක්‍රයෝ සතිස් දෙනෙක්; චවිංසු, චුතවූහ.

මන්ධාතා පන, මන්ධාතු රජතෙම වනාහි; මනුස්ස පරිහාරෙන, මිනිස් ලීලාවෙන්; දෙවරජ්ජං, දිව්‍යරාජ්‍යය; කාරෙසී එව, කරවූයේමය; තස්ස, ඔහුට: එවං, මෙසේ; කාලෙ ගච්ඡන්තෙ, කල් යන කල්හි; භීයොසොමත්තාය, ප්‍රමාණයට වැඩියෙන්; කාම තණ්හා, කාමාශාව; උප්පජ්ජි, උපන්නේය; සො, හෙතෙම; මෙ, මට; උපඩ්ඪ රජ්ජෙන, අඩ රාජ්‍යයෙන්; කිං, ප්‍රයෝජන කිම්ද; සක්කං, ශක්‍රයා; මාරෙත්වා, මරවා; එක රජ්ජං, තනි රාජ්‍යය; කරිස්සාමි ඉති, කරන්නෙමියි; චින්තෙසි, සිතීය; සක්කං පන, ශක්‍රයා වනාහි; මාරෙතුං, මරන්ට; න සක්කා, නොහැක්කේය; එසා කාමතණ්හා පන, මේ කාම තෘෂ්ණාව වනාහි; විපත්තිමූලා, විපතට මුල් වන්නීය; තථාහි, ඒ එසේමැයි.

7. අත්‍ර, මෙතැන; වරං, උතුම්ය; අත්‍ර, මෙහි; සුඛං ඉති, සැපයයි; අතිච්ඡා, අධික තෘෂ්ණාවෙන්; විහතො, නටුවා වූ; නරො, මනුෂ්‍යතෙම; ඉධවා, මේ ලෝකයෙහි ද; පරත්‍ථවා, පරලොවද; සදා, හැම කල්හි; කිඤ්චි සාතං, කිසි සැපයක්; න වින්‍දතෙ, නොවිඳියි.

8. තණ්හාය, තෘෂ්ණාව කරණකොට ගෙන; සොකො, ශෝකය තෙම; ජායතෙ, උපදී; තණ්හාය, තෘෂ්ණාව කරණකොටගෙන; භයං, බිය; ජායතෙ, උපදී; තණ්හාය, තෘෂ්ණාවෙන්; විප්පමුත්තස්ස, වෙන්ව මිදුනහුට; සොකො, ශෝකයක්; නත්‍ථි, නැත; භයං, බියක්, කුතො, කොයින්ද?

9. එත්‍ථ, මේ ලෝකයෙහි; තණ්හාදසො, තෘෂ්ණාවට ගැති වූ; නරො, මිනිස් තෙම; රාජ චොරාදි සම්භවං, රජ, සොර, ආදීන්ගෙන් වන්නා වූ; හත්‍ථච්ඡෙදාදිකං, අත් කැපීම් ආදී වූ; දුක්ඛං, දුකට; පාපුණාති, පැමිණෙයි; විහඤ්ඤති, (එතිසාම) වෙසෙසින් නැසෙයි.

10. ඛෙත්තං වත්‍ථුං, කෙත් වත්ද; හිරඤ්ඤංච, රත්රන්ද; ගවාස්සං, ගවයන් හා අශ්වයන් ද; දස පොරිසං, දාසයන් හා සෙසු පිරිවර ජනයා ද (නිසා); ජාතෙන, හටගත්තා වූ; යෙන ලොභෙන, යම් ලොභයක් කරණකොටගෙන; පාණිනො, ප්‍රාණීහු; සදා, සැම කල්හිම; ජීයන්ති, පිරිහෙත්; විඤ්ඤුනා, නුවණැත්තන් විසින්; සො ලොභො, ඒ ලෝභය තෙම; සබ්බත්‍ථාමෙන, සියළු ශක්තියෙන්; පහාතබ්බා එව, පහ කටයුත්තේමය.

11. තතො, ඉක්බිති; අතිච්ඡාවිහතස්ස, අධික තෘෂ්ණාවෙන් නටුවා වූ; තස්ස, ඔහුගේ; ආයු සඞ්ඛාරො, ආයු ශක්තිය; පරිහායි, පිරිහුනේය; ජරා, ජරා තොමෝ; සරීරං, ශරීරයට; පහරි ගැසී; මනුස්ස සරීරංහි නාම, මනුෂ්‍ය ශරීරය නම්; දෙව ලොකෙ, දිව්‍ය ලෝකයෙහි; න භිජ්ජති, නොබිඳෙයි (හෙවත් නොමියයි); අථ, එකල්හි; සො, ඒ මන්ධාතු රජතෙම; දෙව ලොකා, දෙව් ලොවින්; භස්සිත්වා, බැස; බන්‍ධුමතී නගරුය්‍යානෙ, බන්ධුමතී නුවර උද්‍යානයට; ඔතරි, බැස්සේය; උය්‍යානපාලො, උයන්පල්ලා; තස්ස, ඔහු; ආගත භාවං, ආ බව; රාජකුලං, රජ ගෙදරට; නීවෙදෙසි, දැන්වීය; රාජා, රජතෙමේ; රාජකුලා, රජ ගෙදරින්; ආගන්ත්වා, අවුත්; උය්‍යානෙ එව, උයනෙහිම; ආසනං, ආසනයක්; පඤ්ඤපෙසි,

පැනවීය; තතො, ඉක්බිති; මන්ධාතා, මන්ධාතු රජතෙම; උය්‍යානෙ, උයනෙහි; පඤ්ඤත්තා, පනවන ලද; වර, උතුම් වූ; ආසනෙ, ආසනයෙහි; නිපනෙනා, හොත්තේ; අනුට්ඨානසෙය්‍යං, නැවත නොනැගිටින සැතපීම; කප්පෙසි, කෙළේය; තතො, ඉක්බිති; අමච්චා, අමාත්‍යවරු; දෙව, දේවයන් වහන්ස! තුම්හාකං, ඔබ වහන්සේ ගැන; පුරතො, මතු දවස; කින්නුකථෙස්සාම ඉති, (මහජනයාට) කුමක් කියන්නෙමුදැයි; පුච්ඡිංසු, විචාළාහුය; මන්ධාතු මහා රාජා, මන්ධාතු මහ රජ තෙම; ද්වි සහස්ස පරිත්ත ද්වීප පරිවාරෙසු, දෙදහස් කොදෙව් පිරිවර කොට ඇති; චතුසු මහා දීපෙසු, සතර මහා දිවයිනෙහි; චක්කවත්ති රජ්ජං, චක්‍රවර්ති රාජ්‍යය; කාරෙත්වා, කරවා; චාතුම්මහාරාජිකෙසු, චාතුර් මහාරාජික දෙවියන් අතරෙහිද; රජ්ජං, රාජ්‍යය; කාරෙත්වා, කරවා; ඡත්තිංස සක්කානං, සතිස් ශක්‍ර කෙනෙකුන්ගේ; ආයු පරිමාණෙන, ආයු ප්‍රමාණයෙන්; දෙවලොකෙ, දිව්‍යලොකයෙහි; රජ්ජං කාරෙත්වා, රාජ්‍යය කරවා; කාලං අකාසි ඉති, කළුරිය කෙළේය යන; ඉමං සාසනං, මේ හස්න; තුම්හෙ, තෙපි; මම, මාගේ; (ඇවෑමෙන්) පුරතො, මතු දවස; මහාජනස්ස, මහජනයාට; කථෙය්‍යාථ ඉති, කියව් යයි කීය; සො, ඒ රජතෙම; එවං වත්වා, මෙසේ කියා; කාලං කත්වා, කළුරිය කොට; යථා කම්මං, කම්වූ පරිදි; ගතො, ගියේය.

භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉමං අත්ථං, මේ අර්ථය; පකාසෙතුං, ප්‍රකාශ කරන්ට; චතුමහා පරිසමජ්ඣෙ, සිවුමහ පිරිස් මැද; ඉමා ගාථායො, මේ ගාථාවන්; ආහ, වදාළ සේක.

12. චන්දිම සුරියා, සඳ හිරු දෙදෙන; යාවතා, යම්තාක් තැන්; පරිහරන්ති, පරිහරණය කෙරෙත්ද; විරොචනා, සවකීය-ලෝකයෙන්; දිසා, දිශාවන්හි; භන්ති, බබලත්ද; තාව, ඒතාක් තැන්; පඨවිංසිතා, පොළොව ඇසුරු කළා වූ; යෙ පාණා, යම් ප්‍රාණීහු වෙත්ද; සබ්බෙව, ඒ සියල්ලෝම; මන්ධාතා, මන්ධාතු රජහුගේ; දසා, දසයෝ වෙත්.

13-14 කහාපණ වස්සෙන, කහවනු වර්ෂාවෙන්ද; කාමෙසු, පස්කම් සැපයෙහි; තිත්ති, තෘප්තියක්; න විජ්ජති, නැත්තේය; (එහෙයින්) පණ්ඩිතා, පණ්ඩිත වූ; සො සම්මා සම්බුද්ධ සාවකො, ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රාවක තෙම; කාමා, වස්තුකාම - ක්ලෙශ කාමයෝ; අප්පස්සාදා, ආශ්වාද රහිතයහ; දුක්ඛා, දුක් ඇත්තෝය; ඉති, මෙසේ; විඤ්ඤාය, දැන; දිබ්බෙසු කාමෙසු අපි,

දිව්‍ය වූ පඤ්ච කාමයන්හි පවා; රතිං, ඇල්මකට; න අධිගච්ඡති, නොපැමිණෙයි; තණ්හක්ඛය රතො හොති, තෘෂ්ණා ක්‍ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි ඇළුනේ වේ.

තං සුත්වා, ඒ අසා; බහු, බොහෝ ජනයා; සොතාපත්ති ඵලාදීහි, සෝවාන් ඵලාදියට; පාපුණිංසු, පැමිණියාහුය.

15. භො, පින්වත්නි; ඉති, මෙසේ; බොධියා, සම්‍යක් සම්බොධියට; ගති නියතානං, නියම ගමන් ඇති; උත්තමානං, උත්තමයන්ටද; තණ්හා, තෘෂ්ණා තොමෝ; සක වසං, සිය වසයට; උපනෙත්වා, පමුණුවා; දුක්ඛානි දෙති, දුක් දෙයි; අනියත ගතිකානං, නියත ගති නැත්තා වූ; මාදිසානං, මා වැන්නවුන්ට; කා කථා, කියනුම කවරේද?; ඉති, මෙසේ; මන්ත්වා, දැන; තං, ඒ තෘෂ්ණාව; ජහථ, දුරු කරව්; තිවත්ථුං, තෙරුවන්; භජථො, භජනය කරව්.

**මහා මන්ධාතු වත්ථුං අට්ඨමං.**

**මහා මන්ධාතු කථා වස්තුව අටවැන්නයි.**

## 9. බුද්ධවම්ම වෙළෙන්දගේ කථාව

බුද්ධවම්ම වාණිජකස්ස, "බුද්ධවම්ම" නම් වෙළෙන්දගේ; වත්ථුම්හි, කථා වස්තුවෙහි; අයං, මේ තොමෝ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.

1. ජම්බුදීපෙ කිර, දඹදිව වනාහි; පාටලිපුත්ත නගරෙ, පැළලුප් නුවර, වාණිජක කම්මෙන, වෙළෙඳමෙන්; ජීවමානො, ජීවත් වන්නා වූ; බුද්ධවම්මො නාම, බුද්ධවම්ම නම්; වාණිජො, වෙළෙන්දෙක්; අහොසි, වූයේය; සො, හෙතෙම; අපරභාගෙ, පසු කාලයෙහි; සත්වාහෙහි සද්ධිං, ගැල්කරුවන් හා සමඟ; ගාම නිගම ජනපද රාජධානිසු, ගම් නියම්ගම්, රාජධානින්හි; වණිජ්ජං පයොජයමානො, වෙළඳම් කෙරෙමින්; විචරති, හැසිරෙයි.

තස්මිං සමයෙ, එසමයෙහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නෙක භික්ඛු සහස්ස පරිවුතො, නොයෙක් දහස් ගණන් භික්‍ෂූන් විසින් පිරිවරණ ලද්දේ; බහු දෙව මනුස්සෙ, බොහෝ දෙව් මිනිසුන්; සංසාර කන්තාරා, සසර කතරින්; උත්තාරෙන්තො, එතෙර කරමින්;

ජනපදචාරිකං, ජනපද චාරිකාවෙහි; චරති, හැසිරෙන සේක; තදා, එකල්හි; සො, ඒ වෙළඳ තෙම; ද්වත්තිංසලක්ඛණානුබ්‍යඤ්ජන පතිමණ්ඩිතං, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජනයන්ගෙන් සැරසුනා වූ; ජලමාන, දිලිසෙන්නා වූ; සුවණ්ණ මෙරුං විය, රන් මෙරක් මෙන්; විරොචමානං, බබලන්නා වූ; මහා භික්ඛුසඞ්ඝ පරිවුතං, මහා භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්ද වූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අද්දස, දුටුවේය; දිස්වා, දැක; පරම පීතියා, උතුම් වූ ප්‍රීතියෙන්; ඵුට සරීරො, පිනා ගිය ශරීර ඇත්තේ; අඤ්ජලිම්පග්ගය්හ, ඇඳිලි බැඳ; භගවන්තං උපසඞ්කමිත්වා, බුදුන් වෙත එළඹ; වන්දිත්වා, වැඳ; බුද්ධ සාසනෙ, බුදු සසුන්හි; අපරිචිත භාවෙන, නුපුරුදු බැවින්; සායණ්හෙ, සවස; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; භත්තෙන, බතින්; නිමන්තෙසි, ආරාධනා කෙළේය; අථ, එකල්හි; අස්ස, ඔහුට; භගවා, භාග්‍යවතුන් වහන්සේ (වදරණ සේක්); භො, පින්වත; තථාගතා, බුදුවරයෝ; විකාල භොජනා, විකාල භෝජනයෙන්; පටිවිරතා ඉති, වෙන්වූවාහු යයි; ආහ, වදාළ සේක; අථ, එකල්හි; සො, හෙතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; වන්දිත්වා, වැඳ; භන්තෙ, සවාමීනි; භගවන්තා, භාග්‍යවතුන් වහන්සේලා; විකාලෙ, විකාලයෙහි; කිං, කුමක්; භුඤ්ජිස්සන්ති ඉති, වළඳන්නාහුදැයි; ආහ, විචාළේය; අථ, එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අස්ස, ඔහුගේ; කථා පටිච්ච, කථාව නිසා; අට්ඨවිධ පානං, අටවැදෑරුම් පානයක්; තථාගතානං, බුදුවරුන්ට; විකාලෙ, පස්වරු කාලයෙහි; භුඤ්ජිතුං, වළඳන්ට; කප්පති, කැපවේ; සෙය්‍යථීදං, ඒ කවරේද; 1. අම්බපානං, අඹපැන්; 2. ජම්බුපානං, දඹ පැන්; 3. චොචපානං, ඇට කෙසෙල් පැන්; 4. මොචපානං, මස් කෙසෙල් පැන්; 5. ඵාරුසක පානං, උගුරැස්ස පැන් (= බොරළු දමුනු පැන්); 6. මධුපානං, මී පැන්; 7. මුද්දික පානං, මිදි පැන්; 8. සාලුක පානං ඉති, ඕලු පැන් යයි (වදාළ සේක.)

වාණිජො, වෙළඳ තෙම; තං සුත්වා, ඒ අසා; සහ සක්කරා රසෙහි, උක් හකුරු හා සමඟ; මුද්දික පානං කත්වා, මුද්‍රික පානයක් සකස් කොට; බුද්ධ පමුඛස්ස, බුදුන් ප්‍රධානකොට ඇති; භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සංඝයා වහන්සේට; අදාසි, දුන්නේය; ස භික්ඛු සඞ්ඝො, භික්ෂු සඞ්ඝයා සහිත වූ; සත්ථා, ශාස්තෲන් වහන්සේ; පරිභුත්තා, වළඳන ලද; පානීය රසො, පැන් රස ඇත්තේ; තස්ස,

ඔහුට; ධම්මං දෙසෙත්වා, ධර්ම දේශනා කොට; ජනපද චාරිකං, ජනපද චාරිකාවට; පක්කාමි, වැඩි සේක.

2. සො පි, ඒ වෙළඳ තෙමේද; පසන්න මානසො හුත්වා, පහන් සිත් ඇතිව; නිවත්තො, නැවතුනේ; වාණිජකෙහි සද්ධිං, වෙළෙඳුන් හා සමඟ; තෙසු තෙසු ජනපදෙසු, ඒ ඒ ජනපදයන්හි; වණිජ්ජං, වෙළඳාම; පයොජෙන්තො, යොදන්නේ; මහාවත්තනියං නාම, මහාවත්තනිය නම් වූ; කන්තාරං, කාන්තාරයට; පාපුණි, පැමිණියේය; තත්ථ, එහිදී; තෙසං, ඔවුන්ගේ; සබ්බෙසු එව සකටෙසු, සියළුම ගැල්හි; පානියං, පැන්; පරික්ඛයං අගමාසි, ගෙවීමටම ගියේය; තත්ථ, එහි; සබ්බ මනුස්සානංච, සියලු මිනිසුන්ටද; බලිවද්දනං ච, ගොනුන්ට ද; පානීයං, පැන්; නාහොසි, නොවීය; අථ, එකල්හි; සො වාණිජො, ඒ වෙළඳ තෙම; පිපාසාභිභූතො, පිපාසයෙන් පෙළුනේ; තෙසු තෙසු සකටෙසු, ඒ ඒ ගැල්වල; පානීයං, පැන්; පරියෙසන්තො, සොයමින්; විචරති, හැසිරෙයි; අථ, එකල්හි; එකස්මිං සකටෙ, එක් ගැලෙක්හි; මනුස්සා, මනුෂ්‍යයෝ; තං, ඔහු; දිස්වා, දැක; කාරුඤ්ඤෙන, කරුණාවෙන්; එත්ථ, මෙහි; ආගච්ඡ, එව; ඉමස්මිං කොලම්බෙ, මේ සැළෙහි; ථොකං පානීයං, පැන් ටිකක්; අත්ථි, ඇත; පිව ඉති, බොන්නැයි; වදිංසු, කීවාහුය; තතො, ඉක්බිති; සො, හෙතෙම; ගන්ත්වා, ගොස්; පානීයං, පැන්; පිවි, බීවේය; තස්ස, ඔහුට; තං රසං, ඒ රසය; මුද්දික පාන රස සදිසං අහොසි, මිදි පැන් රස හා සමාන විය; පිවන්තොව; බොමින්ම; සො, හෙතෙම; එවං මෙසේ; චින්තෙසි, සිතීය; තදා, එකල්හි; සම්මා සම්බුද්ධස්ස, සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට; මෙ, මා විසින්; දින්න මුද්දික පානස්ස, දෙන ලද මුද්‍රික පානයාගේ; නිස්සන්දො, කුසල විපාකය; අජ්ජ, අද; සම්පත්තො, භවිස්සති ඉති, පැමිණියේවනැයි; අච්ඡරබ්භූත චිත්තො, ආශ්චර්‍ය්‍ය අද්භූත සිත් ඇත්තේ; සොමනස්ස ජාතො, හටගත් සොම්නස් ඇත්තේ; ගන්ත්වා, ගොස්; සයං එව, තෙමෙම; චාටියා, සැළෙහි; පිධානං, පියන; විවරි, විවෘත කෙළේය; සකලාපි සාචාටි, ඒ සියලුම සැළ; මුද්දික පානෙන, මිදි පැනින්; පරිපුණ්ණා අහොසි, පිරුණේ විය; තතො, ඉක්බිති; සො, හෙතෙම; රසවන්තං, රසවත් වූ; ඔජවන්තං, ඕජස් ඇත්තා වූ; අපරික්ඛයං, නොපිරිහෙන්නා වූ; දිබ්බපාන සදිසං, දිව්පැන් සමාන වූ; පානීයං, පැන්; දිස්වා, දැක; පරමාය පීතියා, මහා ප්‍රීතියෙන්; පුට සරීරො, පිනාගිය

ශරීර ඇත්තේ; සබ්බෙ, සියල්ලෝ; පානීයං, පැන්; පිවන්තු ඉති, බොත්වායි; උග්ඝොසෙසි, හඬ නගා දැනුම් දුන්නේය; තං සුත්වා, ඒ හඬ අසා; සබ්බෙ, සියල්ලෝම, සන්නිපතිත්වා, රැස්ව; පානීයං, පැන්; දිස්වා, දැක; අබ්භූත චිත්තා ජාතා, පුදුම වූ සිත් ඇත්තෝ වූහ; වාණිජො, වෙළෙඳ තෙම; තෙසං මජ්ඣෙ, ඔවුන් මධ්‍යයෙහි; බුද්ධානුභාවං, බුද්ධානු භාවය; පකාසෙන්තො, ප්‍රකාශ කරමින්; ආහ, මෙසේ කීය.

3. භො, පින්වත්නි! භවන්තා, තෙපි; මහෙසිනො, බුදුන්වහන්සේගේ; සන්දිට්ඨිකං, මෙලොවදීම විපාක දෙන; අකාලිකං, කල් නොයවා විපාක දෙන; අචින්තනීයං, නොසිතිය හැකි; අච්ඡෙරං, ආශ්චර්ය්‍ය වූ; ඉදං ආනුභාවං, මේ ආනුභාවය; පස්සථ, බලව්.

4. බුද්ධෙ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි; පසන්න මනසා, පැහැදි සිතින්; මයා, මා විසින්; පානීයකං, පිය යුත්තක්; දින්නං, දෙන ලදී; තං දනං, ඒ දනමය කුසලය; ඉදනි එව, දැන්ම; මුනිවහසා, බුද්ධානුභාවයෙන්; විපච්චති, විපාක දෙයි.

5. දෙවානං, දෙවියන්ගේ; ඔජවන්තං, ඕජස් ඇති; සුධන්නං ඉව, සුධා භොජනය වැනි; දිබ්බපානං ඉව, දිව පැනක් වැනි; අබ්භූතං, අද්භූත වූ; අක්ඛයා, ක්ෂය නොවන්නා වූ; සීතලං, සිහිල් වූ; මධුරොදකං, මිහිරි ජලයක්; ජාතං, උපන්නේය.

6. කො නාම විචක්ඛණො, කවර නම් නැණවතෙක්; ඉධ ලොකෙ, මෙලොවද; පරත්‍ථෙ ච, පරලොවද; සුඛදං, සැප දෙන්නා වූ; උත්තමං, උතුම් වූ; දනං, දනය; සීල වන්තෙසු, සිල්වතුන් විෂයෙහි; න දදෙය්‍ය, නොදෙන්නේ ද? (දෙන්නේමය.)

7. මධුරොදකං, මිහිරි ජලය; යථා ඉච්ඡිතං, කැමැති පරිද්දෙන්; ගහෙත්වාන, ගෙන; පිවන්තු, බොත්වා! යථා ඉච්ඡිතං, අභිමත පරිද්දෙන්; භාජනානි ච, භාජනයන්ද; පූරෙත්වා, පුරවාගෙන; සබ්බෙ, සියල්ලෝ; යන්තු ඉති, යෙත්වා යි (කීයේය.)

8. එවං ච පන වත්වා, මෙසේ ද කියා වනාහි; සබ්බෙ මනුස්සෙ ච, සියලු මනුෂ්‍යයන් ද; බලිවද්දෙ ච, ගොනුන්ද; මුද්දික රසෙන එව, මිදි රසයෙන්ම; සන්තප්පෙසි, සන්තර්පණය කෙළේය; තතො තතො, ඒ ඒ තැනින්; ආගතාගතා අපි, ආ ආවෝද; පානීයං, පැන්; පිවිංසු, බීවාහුය; තථාපි, එතකුදු වුවත්; පානීයං, පැන්; අක්ඛයං අහොසි, ක්ෂය නොවුයේය.

තතො, ඉක්බිති; වාණිජො, වෙළෙඳ තෙම; සත්ථවාහෙහි සද්ධිං, ගැල්කරුවන් සමඟ; වණිජ්ජං පයොජෙත්වා, වෙළෙඳම් කොට; සකනගරං, සිය නුවරට; ආගච්ඡන්තො, එන්නේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පස්සිත්වා, දැක; ගමිස්සාමි ඉති, යන්නෙමියි (සිතා); වෙළුවනං, වේළුවන විහාරයට; ගන්ත්වා, ගොස්; සත්ථාරං, බුදුන්වහන්සේ; වන්දිත්වා, වැඳ; සත්ථාරා, බුදුන් විසින්; කත අනුමොදනො, කරන ලද අනුමෝදනා ඇත්තේ; එකමන්තං, එකත්පසෙක්හි; නිසීදි, හුන්නේය; සත්ථාපි, ශාස්තෘන් වහන්සේ ද; තෙන සද්ධිං, ඔහු සමඟ; මධුර පටිසන්ථාරං අකාසි, මිහිරි වූ පිළිසඳර කථා කෙළේය; උපාසකො අපි, උපාසක තෙමේද; භන්තෙ, සවාමීනි! තුම්හාකං, නුඹ වහන්සේගේ; පාටිහාරියං, ප්‍රාතිහාර්යයක්; දිස්වා, දැක; පසන්නො පැහැදුණෙමි; වන්දිත්වා, වැඳ; ගමිස්සාමි ඉති, යන්නෙමියි (සිතා); ආගතො අම්හි, ආයේ වෙමි; පාටිහාරියං, පෙළහැර; එවං ච එවං ච ඉති, මෙසේ මෙසේ යයි; විත්ථාරෙන, විස්තර වශයෙන්; කථෙසි, කීයේය; අථ, එකල්හි; අස්ස, ඕ හට; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ධම්මං දෙසෙයි, ධර්ම දේශනා කළ සේක.

සො, හෙතෙම; ධම්මං සුත්වා, බණ අසා; සත්ථාරං, බුදුන් වහන්සේට; ස්වාතනාය, සෙට දවසට; නිමන්තෙත්වා, ආරාධනා කොට; මහා දානං, මහා දනයක්; දත්වා, දී; අත්තනො, තමාගේ; ගෙහං එව, ගෙදරටම; අගමාසි, ගියේය. සො, හෙතෙම; තතො පට්ඨාය, එතැන් පටන්; දානාදීනි, දන්දීම් ආදි වූ; පුඤ්ඤානි, පින්කම්; කත්වා, කොට; තතො, ඒ අත් බැවින්; චුතො, චුත වූයේ; දෙව ලොකෙ, දිව්‍යලොකයෙහි; ද්වාදසයොජනිකෙ, දෙළොස් යොදුන් ඇති; කනකවිමානෙ, රන් විමනෙක්හි; දෙවච්ඡරා පරිවුතො, දෙවඟනන් විසින් පිරිවරණ ලදුව; දෙවිස්සරිය සමන්නාගතො, දිව්‍ය ඓශ්වර්යයෙන් යුක්තව; නිබ්බත්ති, උපන්නේය; තස්ස, ඔහුගේ; පුබ්බ කම්ම පකාසනත්ථං, පූර්ව කර්මය ප්‍රකාශ කිරීම් වශයෙන්; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; රතන භාජනානි, රන් බඳුන්; දිබ්බමයෙහි, දිව්‍යමය වූ; මුද්දිකපානෙහි, මිදි පානයෙන්; පරිපුණ්ණානි අහෙසුං, සම්පූර්ණ වූහ; පානීයං, පැන්; පිවිත්වා, බී; දෙවා, දෙවියෝ; නච්චන්ති, නටත්; වාදෙන්ති, වයත්; කීළන්ති, කෙළිත්.

9. විපුල, මහත් වූ; ජිනසාරං, සර්වඥ ගුණ සාගරය; නජානමානො, නොදන්නා වූ; ජනො, සත්වතෙම; එවං, මෙසේ;

තොය මත්තසස, පැන් පමණක්; දනා, දීමෙන්; විපුලං, මහත් වූ; භොගං, සම්පත්; ලභති, ලබයි; භො, පින්වත්නි! තීසුවත්ථූසු, රත්නත්‍රයෙහි; විදිත, දන්නා ලද; ගුණ ගණා, ගුණ සමූහය ඇති; තුමෙහ, තෙපි; සීලවන්තෙසු, සිල්වතුන් විෂයෙහි; දනා, දන් දීමෙන්; බහු, බොහෝ වූ; විසෙසං, විශෙෂ සම්පත්; ලභථ, ලබව්.

බුධවම්මවණිජ කසස වත්ථුං නවමං, බුද්ධවම්ම වෙළෙඳගේ කථා වස්තුව නවවැන්නයි.

## 10. රූප දේවියගේ කථාව

රූප දෙවියා, රූප දේවියගේ; වත්ථුම්හි, කථා වස්තුවෙහි; අයං, මෝතොමෝ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.

1. අතීතෙ කිර, යටගිය දවස වනාහි; විපස්සිස්ස, විපස්සී නම් වූ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; කාලෙ, කාලයෙහි; බන්ධුමතී නාම, බන්ධුමතී නම් වූ; නගරං අහොසි, නුවරක් විය; තස්මිං නගරෙ, ඒ නුවර; එකාගාමදරිකා, එක් ගම් දැරියක්; විහාරෙ, විහාරයෙහි; ආහිණ්ඩන්ති, ඇවිදින්නී; එකං ගිලාන භික්ඛුං, එක් ගිලන් භික්ෂුවක්; දිස්වා, දැක; කම්පමාන හදයා, කම්පා වූ සිත් ඇත්තී; උපසඞ්කමිත්වා, ළඟට එළඹ; වන්දිත්වා, වැඳ; භන්තෙ, සවාමීනි! කො ආබාධො, කිනම් ආබාධයක්; තෙ, ඔබවහන්සේගේ; සරීරං, ශරීරය; පීළෙහි ඉති, පෙළාදැයි; පුච්ඡි, විචාළාය; තෙන අපි, උන්වහන්සේ විසින්ද; භගිනි, නැගණියෙනි! බර, කෲර වූ; ආබාධො, ආබාධයක්; මෙ, මාගෙ ශරීරය; පීළෙති ඉති, පෙළා යයි; වුත්තෙ, කී කල්හි; සා ඕතොමෝ; භන්තෙ, සවාමීනි; තෙනහි එසේ වී නම්; අහං, මම; තං රොගං, ඒ රෝගය; වූප සමෙස්සාමි ඉති, සංසිඳුවන්නෙමියි; නිමන්තෙත්වා, පවරා; ගෙහං, ගෙට; ගන්ත්වා, ගොස්; තං පවත්තිං, ඒ පුවත; මාතා පිතුනනං, මවුපියන්ට; කථෙත්වා, කියා; තෙහි, ඔවුන් විසින්; අනුඤ්ඤාතා, අනුදන්නා ලද්දී; පුන දිවසෙ, පසු දවස්හි; නානගගරසෙන, නොයෙක් අග්‍ර රසයෙන්; භෙසජ්ජාහාරං, බෙහෙත් ආහාරයක්; සම්පාදෙසි, සම්පාදනය කළාය; තතො, ඉක්බිති; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; පුන දිවසෙ, දෙවෙනි දවසෙහි; චීවරං, සිවුර; පාරුපිත්වා, පොරවා; භික්ඛාය, පිඩු පිණිස; චරන්තො, හැසිරෙන්නේ; තස්සා, ඒ

ගම්දැරියගේ; ගෙහං, ගෙට; ගන්ත්වා, ගොස්; අට්ඨාසි, සිටියේය; සා, ඕ තොමෝ; ආගතං, වැඩියා වූ; ථෙරං, තෙරුන් වහන්සේ; දිස්වා, දැක; සොමනස්ස ජාතා, හටගත් සොම්නස් ඇත්තී; පත්තං පාත්‍රය; ගහෙත්වා, ගෙන; ආසනං, ආසනයක්; පඤ්ඤාපෙත්වා, පණවා; අදසි, දුන්නාය; තත්ථ, එහි; නිසින්නං, වැඩ හුන්; තං, උන්වහන්සේට; ආහාරෙන, ආහාරයෙන්; සාධුකං, මනාකොට; පරිවිසිත්වා, වළඳවා; සක්කාරං අකාසි, සත්කාර කළාය; අථ, එකල්හි; තස්සා, ඇගේ; සද්ධා බලෙන, ශ්‍රද්ධා බලයෙන්; භුත්ත මත්තෙ එව, වැළඳූ කෙණෙහිම; සො, ආබාධො, ඒ ආබාධය; වූපසමි, සංසිඳුනේය; තතො, ඉක්බිති; සො, ඒ භික්ෂූන් වහන්සේ; වූපසන්ත රොගො, සුව වූ රෝග ඇත්තේ; දුතිය දිවසෙ, දෙවැනි දවසෙහි; තස්සා, ඇගේ; ගෙහං, ගෙට; න අගමාසි, නොවැඩියේය; අථ, එකල්හි; සා, ඕ තොමෝ; විහාරං, විහාරයට; ගන්ත්වා, ගොස්; තං, උන්වහන්සේට; වන්දිත්වා, වැඳ; කස්මා, කවර හෙයකින්; නාගතත්ථ ඉති, නොවැඩියේ දැයි; පුච්ඡිත්වා, විචාරා; තෙන, උන්වහන්සේ විසින්; භගිනි! නැගණියෙනි! මෙ, මාගේ; ව්‍යාධි, රෝගය; වූපසමි, සුව විය; තස්මා, එහෙයින්; නාගතොසම් ඉති, නො ආයෙමියි; වුත්තෙ කීකල්හි; සා, ඕතොමෝ; භන්තෙ, ස්වාමීනි! සාධු ඉති, මැනැවැයි; සොමනස්ස ජාතා, හටගත් සොම්නස් ඇත්තී; ගෙහං එව, ගෙදරටම; අගමාසි, ගියාය.

2. සා, ඕ තොමෝ; තෙන පුඤ්ඤ කම්මෙන, ඒ පුණ්‍ය කර්මයෙන්, කාලං කත්වා, කළුරිය කොට; දෙව ලොකෙ, දිව්‍ය ලෝකයෙහි; නිබ්බත්ති, උපන්නාය; තත්ථ, එහි; තස්සා, ඇට; ද්වාදස යොජනිකං, දොළොස් යොදුන් පමණ වූ; කනක විමානං, රන් විමානයක්; නිබ්බත්ති, පහළ විය; සා, ඕතොමෝ; තත්ථ එහි; දෙවිස්සරියං, දිව්‍ය සම්පත්; අනුභවන්තී, විඳින්නී; ඡ බුද්ධන්තරං බුද්ධාන්තර සයක්; ඛෙපෙත්වා, ගෙවා; අම්හාකං, අපගේ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; කාලෙ, කාලයෙහි; ජම්බුදීපෙ, දඹදිව; දෙවපුත්ත නගරෙ, දෙව්පුත් නුවර; උදිච්ච බ්‍රාහ්මණ කුලෙ, උසස් බමුණු කුලයෙක්හි; ජෙට්ඨ බ්‍රාහමණස්ස; දෙටු බමුණාගේ; භරියාය, භාර්‍යාවගේ; කුච්ඡිම්හි, කුසෙහි; පටිසන්ධිං ගණ්හිත්වා, පිළිසිඳගෙන; පරිපාක මන්වාය, මුහු කිරීමට පැමිණ; මාතුකුච්ඡිතො, මවු කුසින්; නික්ඛමි, නික්මුණාය; තස්සා, ඇට; මාතුකුච්ඡිතො, මවු කුසින්; නික්ඛන්ත කාලතො පට්ඨාය, නික්මුණු කල් පටන්; දිවසෙ දිවසෙ, දවසක් දවසක් පාසා; අට්ඨට්ඨනාළි මත්තං, අට අට

නැළියක් පමණ; සාලි තණ්ඩුලං, සුවඳ ඇල් සහල්; නිබ්බත්තති, උපදියි; තස්සා, ඇගේ; රූප සම්පත්තිං, රූප සම්පත්තිය; දිස්වා, දැක; පසන්නා, ප්‍රසන්න වූ; මාතාපිතරො, මවුපියෝ; රූප දේවි ඉති, රූපදේවි යයි; නාමං අකංසු, නමක් කළාහුය; පච්ඡා, පසුව; තං, ඈ; පතිරූපෙන, සුදුසු වූ; දූරකෙන, කුලදරුවෙකු හා; නියොජේසුං, යෙදවූවාහුය; අථ, එකල්හි; අස්සා, ඈ; තණ්ඩුල නාළි මත්තං, සහල් නැළියක් පමණ; ගහෙත්වා, ගෙන; පවිතුං, පිසන්ට; ආරද්ධෙ, පටන්ගත් කල්හි; ඉච්ඡිත ඉච්ඡිත, කැමැති කැමැති; මච්ඡමංසාදී, මත්ස්‍ය මාංශ ආදී වූ; ව්‍යඤ්ජනංච, ව්‍යඤ්ජනද; සප්පි, ගිතෙල්; නවනීත, වෙඬරු; දධි, මීකිරි; ඛීරාදි, කිරි යනාදී වූ; ගොරසං ච, පස්ගෝ රසද; ජීර මරිචාදි, දූරු මිරිස් ආදි වූ; කටුක භණ්ඩං ච, කුළු බඩුද; කදලි, කෙසෙල්; පනස, කොස්; මධුගුළාදි උපකරණංච, මී උක් සකුරු ආදී උපකරණ ද; භාජනානි, භාජන; පූරෙත්වා, පුරා; නිබ්බත්තති, උපදියි; තාය, ඈ විසින්; හත්ථෙන, අතින්; ගහිතං, ගත්නා ලද; කිංචි, කිසියම්; ඛාදනීයං වා, කෑ යුතු දෙයක් හෝ; භොජනීයං වා, බුදිය යුතු දෙයක් හෝ; පූති භාවං, පිළුණු බවට; න ගච්ඡති, නොයයි; හත්ථුක්කලිං, බත් සැළියක්; ගහෙත්වා, ගෙන; සකල නගරවාසිනො, මුළු නුවර වැසියන්; භොජෙන්තියා අපි, වළඳවන කල්හිදු; එක කටච්ඡු මත්තං, එක හැන්දක් පමණ; හත්තං, බත්; ගහිතට්ඨානං, ගත්නා ලද තැනක්; න පඤ්ඤායති, නො පෙනෙයි; එවං, මෙසේ; අපරික්ඛය පුඤ්ඤ අහොසි, නොපිරිහෙන්නා වූ පින් ඇත්තියක් වූවාය; සකල දෙව පුත්ත නගරෙ, මුළු දෙවුපුත් නගරයෙහි; චන්ද සූරියා ච, සඳ හිරු සේ; පාකටා අහොසි, ප්‍රකට වූවාය; අථ, එකල්හි; සා, ඕ තොමෝ; පඤ්චසත භික්ඛු, පන්සියයක් භික්ෂූන්ට; නිමන්තෙත්වා, ආරාධනා කොට; නිච්චං, නිතර; සක නිවෙසනෙ එව, සිය ගෙදරම; භොජෙති, වළඳවයි; තදා, එකල්හි; තෙසං, ඒ භික්ෂූන්; අන්තරෙ, අතරෙහි; පටිසම්භිදප්පත්තො, සිව්පිළිසිඹියාපත්; මහා සඞ්ඝරක්ඛිත ථෙරො නාම, මහා සඞ්ඝරක්ඛිත නම් වූ ස්ථවිර කෙනෙක්; ඉමිස්සා, මැගේ; පුඤ්ඤානු භාවං, පුණ්‍යානුභාවය; දිබ්බ චක්ඛුනා, දිවැසින්; දිස්වා, දැක; එසා, මෝතොමෝ; අත්තනා, තමා විසින්; පුබ්බෙ, පෙර; කත, කරන ලද; කම්මං, කර්‍මය; න ජානාති, නො දනියි; අහං, මම; අස්සා, ඈට; පකාසෙය්‍යං, ප්‍රකාශ කෙළෙම් නම්; යන් නූන ඉති, ඉතා යෙහෙකැයි; (සිතා) එකදිවසං එක දවසක්; තස්සා, ඇගේ; නිවෙසනෙ, ගෘහයෙහි; භුඤ්ජිත්වා, වළඳා; අනු-

මොදනං, අනුමොදනාව; කරොන්තො, කරන්නේ; භගිනි, නැගණියනි! තයා, තී විසින්; පුබ්බෙ, පෙර; කතකම්මං, කරන ලද කුසල කර්මය; ජානාසි ඉති, දන්නෙහිදැයි; පුච්ඡි, විචාළේය. භන්තෙ, සවාමීනි! න ජානාමි, නොදනිමි; සොතුං, අසන්ට; ඉච්ඡාමි ඉති, කැමැත්තෙමියි (කීවාය); අථ, එකල්හි; සො, ඒ ස්ථවිරතෙම; අස්සා, ඇගේ; පුබ්බකම්මං, පූර්ව කර්මය; පකාසෙන්තො, ප්‍රකාශ කරන්නේ.

3. ඉතො, මේ කල්පයෙන්; එකනවුතෙ කප්පෙ, ඒකානූවන කල්පයෙහි; ලොකෙ, ලෝකයෙහි; ලොකෙක නායකො, ලෝකයට අසහාය නායක වූ; ඡින්න බන්ධනො, බිඳින ලද සසර බැඳුම් ඇති; විපස්සීනාම නායකො, විපස්සී නම් වූ බුදු කෙනෙක්; අහොසි, වීය.

4-5 තදා, එකල්හි; රම්මෙ, සිත්කළු වූ; තස්මිං පුරෙ, ඒ නගරයෙහි; ත්වං තී; ගාමදාරිකාආසි, ගම්දැරියක් වූවාය; විහාරස්මිං (එහි) විහාරයෙහි; ආහිණ්ඩන්ති, ඇවිදින්නී; රොගාතුරං, රෝගාතුර වූ; කිසං, කෘශ වූ; පණ්ඩුං, පඬුවන් වූ; මුහුං මුහුං, ක්‍ෂණ ක්‍ෂණයෙහි; අස්සසන්තං, ආශ්වාස කරන්නා වූ; ජිනසාවකං, සර්වඥ ශ්‍රාවකයෙකු; අද්දක්ඛි, දුටුවාය; දිස්වාන, දැක; කම්පිත චිත්තා, කම්පා වූ සිත් ඇත්තී; තං මුනිං, ඒ භික්‍ෂුවට; නිමන්තෙත්වා ආරාධනා කොට.

6. ත්වං, තී; භෙසජ්ජං ච, බෙහෙත්ද; භත්තං ච, බත් ද; අදා, දුන්නීය; තෙන, ඒ කරණකොටගෙන; සො යති, ඒ භික්‍ෂූන් වහන්සේ; අබ්‍යාබාධො, ලෙඩ රහිත වූයේ; අනීඝො, නිරෝගී වූයේ; අනුපද්දවොච ආසි, නිරුපද්‍රව ද වීය.

7. තතො, ඉක්බිති; ත්වං, තී; තතො, එ අත්බැවින්; චුතා, චුත වූවා; සුකතෙන, මනාකොට කරන ලද; තෙන කම්මෙන, ඒ කර්මය කරණකොටගෙන; දෙව ලොකස්මිං, දිව්‍ය ලොකයෙහි; ජාතා, උපන්නී; සබ්බකාම සමිද්ධිනී ආසි, සියලු කාම සම්පත්තීන් සමෘද්ධ වූවාය.

8. තත්ථ, එහි; තෙ, තිගේ; පුඤ්ඤතෙජෙන, පින් තෙදින්; රතනමයො, රන්මුවා; මණිථූප සතාකිණ්ණො, මිණිකොත් සිය ගණනින් හෙබියා වූ; කූටාගාරෙහි, ගුළු ගෙවලින්; අලඞ්කතො, අලඞ්කාර වූ; පාසාදෙ, පහයක් වූයේය.

9. නෙකගබ්භ සතාකිණ්ණො, නොයෙක් සිය ගණන් ගබඩාවලින් ගැවසී ගත්තේය; සයනාසන මණ්ඩිතො, ශායනාසන වලින් සැරසුනේය; අච්ඡරාසත සංකිණ්ණො, සිය ගණන් දිව්‍ය අප්සරාවන්ගෙන් ගැවසී ගත්තේය; නච්ච ගීතාදි සංකුලො, නැටුම් ගී කීම් ආදියෙන් ආකුල විය.

10. රම්භා, කෙසෙල්ය අම්බ අඹය; ජම්බු, ජම්බුය; සන්නීර, තැඹිලිය; පූග, පුවක්ය; පුන්නාග, දෙඹය; පාටලී, පළොල්ය; නාගාදි, නාගස්ය යනාදී වූ; තරුසණ්ඩෙහි, වෘක්ෂ සමූහයෙන්; මණ්ඩිත, සැදුම් ලද; උය්‍යාන පන්තිහි, උයන් පෙළින් යුක්තවිය.

11. මධුමත්තාලිපාලිහි, මීබී මත් බඹර වැලින් යුත්; පදුම, පියුම්ය; උපපල, උපුල්ය; කල්හාර, හෙල්මැලිය; සැඳ, වැ කොඳය; (යන) කානන මණ්ඩිතෙ, වනයන්ගෙන් සැදුම් ලද; සරසී සාර සංකුලෙ, මනහර පොකුණුවලින් ගැවසුනා වූ.

12. අනෙකෙහි දෙවපුත්තෙහි, නොයෙක් දිව්‍ය පුත්‍රයන් කරණ කොටගෙනද; තථා, එසේම; දෙවච්ඡරාහි ච, දිව්‍යාඞ්ග-නාවන් කරණකොට ගෙනද; නිච්චුස්සවෙ, නිති උත්සව ඇති; මහා භොගෙ, මහා සම්පත් ඇති; මන නන්‍දනෙ, සිත් කළු වූ; විමානෙ, දිව්‍ය විමානයෙහි.

13. ත්වං, තී; එවං, මෙසේ; දෙවලොකම්හි, දෙව්ලොවෙහි වූ; මහායසං, මහා යශස්; වින්‍දමානා, විඳිමින්; අද්ධානං, දීඝ කාලයක්: වීතිනාමෙත්වා, ගෙවා; ගොතමෙ ජිනෙ, ගෞතම බුදුරජාණන් වහන්සේ; නිබ්බුතෙ, පිරිනිවන් පෑ කල්හි.

14. ත්වං, තී; ඉදනි, දැන්; ජම්බුදීපෙ, දඹදිව; උදිතෙ කුලෙ, ප්‍රසිඩ කුලයක; නිබ්බත්තා, උපන්නීය; පුඤ්ඤ පඤ්ඤ ගුණාවාසා, පින්; පැණ ගුණයන්ට වාසස්ථාන වූවාය; රූපෙන, රූපයෙන්; අග්ගා, අග්‍ර වූවා; පියංවද, ප්‍රිය තෙපුල් කියන්නියක් වූවාය.

15. තෙ, තිගේ; දෙවලොකස්මිං, දිව්‍ය ලොකයෙහි; අබ්භුතං, අද්භූත වූ; එතං දෙවස්සරියං, ඒ දිව්‍ය ඓශ්වර්‍ය්‍යය ද; තෙ, තිට; ඉධ ලොකස්මිං, මෙලොවෙහිදී; සබ්බං, සියලු; ඉමං මානුසිකං, සුඛං, මේ මිනිස් සැපද.

16. තස්ස විපස්සී මුනිනො, ඒ විපස්සී බුදුන්ගේ; කාලෙ, කාලයෙහි; ත්වං හි, තී වනාහි; ගිලානස්ස, ගිලන් වූ; එක භික්ඛුනො, එක් භික්ෂුවකට; දනං, දනයක්; අද, දුන්නීය; තස්ස, ඒ දනයාගේ; තං එලං, ඒ ඵලය; ඊදිසං, මෙබඳුයි.

17. සුඛප්පදං, සැප ලැබීම; ඉච්ඡන්තෙන, කැමැත්තහු විසින්; සදා, හැම කල්හි; පුඤ්ඤං, පින්; කාතබ්බං හි, කට යුත්තේමය; භද්දෙ, යහපත් තැනැත්තිය! තස්මා, එහෙයින්; සබ්බදා, හැම කල්හි; ත්වං, තී; කුසලෙ, කුශල ක්‍රියාවෙහි; උස්සුක්කා භව ඉති, උත්සාහවත් වෙවයි (කීයේය.)

18. එවං, මෙසේ; සො, ඒ සංඝරක්ඛිත ස්ථවිර තෙම; තස්සා, ඇගේ; පුරිමත්තභාවෙ, පෙර ආත්ම භාවයෙහි; කත කම්මං, කරන ලද කුශල කර්මය; පකාසෙත්වා, ප්‍රකාශ කොට; ඉදානි, දැන්; පුඤ්ඤකම්මෙ, පින්කම්හි; අප්පමාද භව ඉති, අප්‍රමාද වෙවයි; අනුසාසි, අවවාද කෙළේය.

සා, ඕ තෙමෝ; ථෙරස්ස, තෙරුන් වහන්සේගේ; ධම්ම දෙසනං, ධර්ම දේශනාව; සුත්වා, අසා; පරම සොමනස්සා, අතිශය සොම්නස් ඇත්තී; තතො පට්ඨාය, එතැන් පටන්; දානාදිසු, දන්දීම් ආදියෙහි; නිරතා, නිරත වූවාය.

පුඤ්ඤානි, පින්; කරොන්තී, කරන්නී; තෙන එව සොම නස්සෙන, ඒ සොම්නසින්ම; සොතාපන්නා, සෝවාන් වූ; අරියසාවිකා අහොසි, ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වූවාය.

19. ඉති, මෙසේ; පුඤ්ඤකම්මෙසු, කුශල කර්මයන්හි; සාරං, සාරයක්; අවිදිත ගුණමත්තා, නොදත් ගුණ මාත්‍රයක් ඇති; සා තරුණ කුමාරී, ඒ තරුණ කුමාරිතොමෝ; භික්ඛුස්ස, භික්ෂුවකට; දානං, දානයක්; දත්වා, දී; දිව මනුජ සුඛං, දෙව් මිනිස් සැප; අලත්ථ, ලැබීය.

භවන්තා, පින්වත්නි! විදිත කුසල පාකා, කුසල් විපාක දන්නා වූ; තුම්හෙ, තෙපි; සන්තිං, නිවන; කිං න ලබ්භෙථ, කිම නොලබන්නාහුද? (ලබන්නාහු මැයි.)

රූපදෙවියා වත්ථුං දසමං, රූප දේවියගේ කථා වස්තුව දසවැන්නයි.)

මාදම්පෙ - ඉරට්ටකුලමැ "වනමල්" වෙශ්මාධීශ,

පාඨශාලාචාර්‍ය්‍ය

**පණ්ඩිත රන්ජිත් වනරත්න (බී. ඒ.)**

විසින් ලියන ලද

රසවාහිනි වනරත්න ව්‍යාඛ්‍යාවෙහි

පළමුවන දහම්සොඬ වර්‍ගය නිමියේය.

# රසවාහිනී - අනුවාදය

## ජම්බුදීප උප්පත්ති කථා

## 1. දහම්සොඬ කථාව

කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ශාසන අන්තර්ධානයෙන් පසු බරණැස් රජුගේ අග මෙහෙසිය කුස බෝසතාණෝ පිළිසිඳ ගත්හ. මොහු උපන් කාලයේ සිට සියලු මිනිසුන්ට ධර්මය ගැන හැඟීමක් පහළ විය. එනිසාම දහම් සොඬ නාමය කුමාරයාට තැබිණ. සව්සත කෙළ පැමිණි තරුණ කුමාරයා දසපින් කිරියවත් පුරන්නේ අබිසෙස් ද ලැබීය. මෙසේ බරණැස් රජය විචාරණ දහම් සොඬ රජතුමා ධර්මයෙන් තොරව රාජ්‍යය විචාරීම නුසුදුසුය යන හැඟීම ඇතිකර ගති. "බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම පදයක් නොඅසා, එම ධර්මයෙන් තොරව රාජ්‍යය කරවීම නුසුදුසුය" යන හැඟීම රජතුමාට තහවුරු විය. එනිසා ඇමැතියන්ගෙන් ධර්මය ගැන විචාළේය. ඔවුහු ධර්මය නොදත්තෙමුයි ප්‍රකාශ කළහ.

රජතුමා ඇතකු පිට කහවණු දහසක් තබා අණබෙර ලවා සතර පදයකින් සංග්‍රහ කරන්නාට එය දෙමියි සනිටුහන් කොට නගරයෙහි ප්‍රචාරය කරවීය. දෙදහස, තුන්දහස ආදී විසින් වැඩි කොට කෝටි ගණන් ධන පරිත්‍යාගයට පිළිණ දුන්නත් බණ කියන්නෙකු සොයාගත නොහැකි විය. මෙසේ දහම් පිපාසයෙන් පෙළුණු රජතුමා දහම් දත්තකු නොලැබ රජය ඇමැතියන්ට පවරා දහම් සොයමින් මහවනයට වැදුණේය.

මෙයින් ශක්‍ර දේවයන්ගේ ආසනය උණු විය. කරුණු සොයන සක් දෙවිඳුට දහම් සොඬ රජතුමා දහම් සොයමින් තමන්ගේ රට, රාජ්‍යය, නෑයන් අත්හැර මහ වනයට පිවිසුණු බව දැක ඔහුට උපකාර කළයුතුය යන තීරණයට බැසගෙන සක් රජ ස්වරූපය අත්හැර බියජනක රකුස් වෙසක් මවාගෙන මහ බෝසත් ඉදිරිපිට පෙනී සිටියේය.

ඉක්බිති මහ බෝසත්තෙම තමා ඉදිරියෙහි වූ රකුසා දැක කිසි බියක් නොමැතිව මොහු බණ දන්නේ නම් යහපතැයි සිතා රකුසා සමඟ කතා කරමින් ධර්මය සොයා රාජ්‍යය අත්හළ බව

ද පවසා ඔබ බණ දත්තේ දැයි විමසීය. රකුසා "මම බණ දනිමි. එම බණට දෙන පූජාව කුමක්දැ" යි විමසීය. බුදුරජුන්ගේ ධර්මය මට දේශනා කරන්නේ නම් ඔබට මගේ සිරුරෙහි මස් හා ලේ දෙන බව පැවැසීය. බඩසා දුකින් පෙළෙන නිසා මස් අනුභව කොට ලේ බී මිස බණ කීමට අපහසු බව රකුසා බෝසතුන්ට කීයේය. මුලින් මගේ මස් කා ලේ බී පසුව කාට බණ කියන්නටදැයි බෝසත්තුමා ඇසීය. එම නිසා යහපත් ක්‍රමයක් දක්වන්නැයි බෝසත් රකුසාගෙන් ඉල්ලීය.

බෝසත්තුමා මෙසේ කී කල්හි රකුසා යුක්තිය මම විසඳමියි අඳුන් පර්වතයක් මවා "මහරජ, මෙහි නැඟ ඔබ මගේ කටට පනින්න. ඒ අතර මම ඔබට බණ කියමි" යි යෝජනා කෙළේය. බෝසතාණෝ මෙසේ කල්පනා කළහ. නොයෙක් ක්‍රමවලින් ජීවිතය විනාශයට යෑම සිරිතකි. මම මේ ජීවිතය ධර්මයට පරිත්‍යාග කළ යුතු යයි තීරණය කොට පර්වත මුදුනට නැඟ සද්ධර්මයට ජීවිතය පුදමියි සතුටු වූ රකුසාගේ දැල්වූ කටට පැන්නේය.

ඉක්බිති ශක්‍රයා රකුසු බව අත්හැර දෙවු අත් බව ගෙන බෝසත්තුමා පිළිගෙන දෙවු ලොවට ගෙන ගොස් දිවමල්, දිව සුවඳ ආදියෙන් පූජා කොට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද

අනිච්චාවත සංඛාරා උප්පාදවය ධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො

යන ගාථාවෙන් ධර්මය දේශනා කෙළේය. පසුව දෙව් සැපත් පෙන්වා බරණැස් රජ විමනට ගෙන ගොස් රජය පවරා දී අවවාද කොට දෙව්ලොවට ගියේය.

## 2. මුව වැද්දගේ කථාව

මෙයට තිස්එක්වැනි කපට පෙරාතුව සිඛී සම්බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණී එක් සමයක විවේක සැපය විඳිමින් එක් වන සෙනසුනක සහල සිවුර එලා වැඩහුන් සේක. දෙව් බඹ ආදීහු එහි රැස්ව උන්වහන්සේට පුදමින් වඳිමින් සිටියහ. ඔවුනට බුදුහු චතුරාර්ය සත්‍යය දේශනා කළහ. එක් මුව වැද්දෙක් දඩයමට

ගොස් මෙසේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ දැක එකත් පස්ව සිට බණ අසා සිත පහද එයින් මියගොස් දෙව්ලොව ඉපිද නැවත නැවතත් සදෙව්ලොවම ඉපිද මේ බුධොත්පාදයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද නුවණ ඇතිව බුදු සසුනෙහි මහණව ගෙණ, දිනක් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මය අසා සිව්පිළිසිඹියාපත්ව සංඝයා මැද දී තමා විසින් කරන ලද පින්කම පිළිබඳ උදානය මෙසේ පැවැසීය.

සිඛී බුදුරජාණන් වහන්සේ මිනිසුන්ට ධර්ම දේශනා කරමින් ජීවත් වූහ. එ සමයෙහි මම මුව වැද්දෙක් වී දඩයමට කැලයට ගියෙමි. දෙව් බඹුන්ට දේශනා කළ චතුරාර්ය සත්‍යය මම ද ඇසීමි. එම පින නිසා දෙව්ලොව ඉපදුනෙමි. නැවත නැවතත් සදෙව්ලොව ඉපිද දෙව් සැපත් වින්දෙමි. ඒ මම දැන් මහ ධනවත් කුලයක ඉපිද වැඩිවියට පත්ව ගිය කල්හි දිනක් දෙව්රම් වෙහෙරට ගියෙමි. එහිදී ශිෂ්‍යයන්ට ධර්මය දේශනා කළ බුදුරජුන් දැක මම ද බණ ඇසීමි. පසුව මහණ වීමි. දැන් නිවන් පසක්කර ගත්තෙක් වෙමි. එබැවින් මම එක වචනයක් කියමි. එනම්, "මනාකොට ධර්මය අසව්" යන වචනයයි.

## 3. යහළුවන් තිදෙනාගේ කථාව

පෙර දඹදිව නියඟයක් ඇතිවිය. මෙයින් ජලචර ආදි සත්තු විනාශයට ගියහ. මහවනයන්හි ගස් කොළන් මලානික විය. පවසින් පීඩිත වූවෝ මිරිඟුව දිය යයි සිතමින් ඔබ්නොබ දුවමින් මහ දුකට පත්වූහ.

මේ අතර එක් ගිරවෙක් වතුර සොයමින් ඇවිද සැටරියන් පමණ එක් නරාවළක ඇති පැන් ගඳ ඉව වැටී කැදරකමට එහි බැස්සේය. බැස අධිකව වතුර බී එයින් ගොඩවීමට අසමත් විය. ඊට පසුව මෙසේම නයෙක් ද, මිනිසෙක් ද වතුර බීමට එහි වැටුනහ. නයාට ද නොපෙනී යෑමට විවේකයක් නොලැබීය. මිනිසාට ද ගොඩවීමට හැකියාවක් නොවීය. මේ තිදෙනාම මරණ බියෙන් බියපත්ව විසූහ.

එක්තරා මිනිසෙක් බරණැසින් මේ කැලයට පැමිණ පැන් සොයන්නේ මෙතැනට පැමිණ කරදරයට පත් මේ තිදෙනා දැක

අනුකම්පා කොට වැල්වලින් කූඩයක් හද සාල්ලක තබා මේ තිදෙනා බේරා ගත්තේය. ඒ තිදෙනාම තමන්ට ජීවිත දනය කළේ යයි සතුටුව "මෙතැන් පටන් ඔබ අපේ මිත්‍රයාය. අපිත් ඔබේ මිත්‍රයෝ වෙමු. අප වසන තැන්වලට එනු කැමැත්තෝ වෙමු." ගිරවා "හිමියාණෙනි, බරණැස දකුණු දොරටුවෙහි ලොකු නුග ගසක් ඇත. එහි මම වසමි. ඔබට අවශ්‍යතාවක් වූ විට මාගේ සමීපයට පැමිණ යහළු සුව යයි අඩ ගහන්න" යයි මිත්‍රකම තහවුරු කොට ගියේය. නයාද කියන්නේ 'එම නුග රුක සමීපයෙහි ලොකු හුඹසක් ඇත. එහි මම වසමි. ඔබට උවමනාවක් වූ විට දීඝ යයි අමතන්න." මීනිසා ද "බරණැස අසුවල් ගෙයි මම වසමි. උවමනාවක් වූ විට එහි එන්න" යයි කියා හෙතෙම ද ගියේය.

පසු කලක උපකාරක මිත්‍රයා ජීවත්වීමට අපහසුව, කියූ සලකුණ සහිත නුග ගස වෙත ගොස් "සම්ම සුව" යයි ඇමතීය. ගිරවා වහා අවුත් සතුටුව පැමිණි කරුණ විචාළේය. ජීවත්වීමේ අපහසුව නිසා පැමිණි බව හේ කීයේය. ගිරවා ස්වල්ප වේලාවක් මෙහිම වාසය කරන්න යයි කියා බරණැස් රජුගේ පොකුණ දෙසට ගියේය. මේ වේලාවේ රජතුමා ආභරණ ගලවා ජල ක්‍රීඩා කරමින් සිටියේය. ගිරවා අතු අතරට වී පරීක්ෂාවෙන් හිඳ ආරක්ෂක පුරුෂයන්ට නොපෙනෙන සේ ආභරණ තැබූ තැනට පැමිණ රජුගේ මුතුහර ගෙන ගියේය. ගෙන ගොස් මිතුරාට දී මෙය රැගෙන ජීවත් වන්න යයි කීය. මිනිසා පැරණි යහළු මිනිසාගේ ගෙදරට ගොස් සියල්ල කීය. මුතුහර ආරක්ෂා සහිතව තබන්න යයි කීය.

මේ අතරතුර ආභරණ පැළඳීමට පැමිණි රජතුමා මුතුහර නැති බව කියා වහාම පරීක්ෂා කරවීය. එහෙත් නොලැබිණ. පසුව අණබෙර යවා මුතුහර ගෙනත් දෙන කෙනෙකුට තෑග්ගක් දෙන බව ප්‍රසිද්ධ කෙළේය. මේ ප්‍රචාරය ගෙහි විසූ මිනිසා අසා මට මොහුගෙන් වැඩක් නැත. මොහු භාර දී තෑග්ග ගනිමියි සනිටුහන් කොට රාජපුරුෂයන් වෙත ගොස් එක් මිනිහෙක් මේ මුතුහර මගේ ගෙයි තබා ඇතැයි දැන්වීය. රාජපුරුෂයෝ වහා අවුත් මුතුහරත්, පුරුෂයාත් රැගෙන රජු සමීපයට ගෙන ගියෝය. රජතුමා මුතුහර සොරකම් කළ අය දිවැස්හුල තැබීමට නියෝග කෙළේය. වධකයන් විසින් ගෙනයනු ලබන මේ උපකාරක මිනිසා

නයාගේ හුඹස දැක ඔහු ගැන කල්පනා වී දීස යයි හඬගෑය. නයා මේ තත්ත්වය දැක කනගාටු වී එහි ගොස් ඔහු සනසා මිනිස් වෙසක් ගෙන මොහොතක් මොහු නොමරවයි කියා රජමැඳුරට ගොස් අගමෙහෙසියට දෂ්ට කෙළේය. ඕ විෂ වේගයෙන් මූර්ඡා වූ පසු නැවත මිනිස් වෙස් ගෙන වධයට නියම වූ මිනිසා ඉතා හොඳ සර්ප විෂ බෙහෙතක් දනී යයි කියා මිත්‍රයා වෙත ගොස්, "රජතුමා ඔබ කැඳවූ විට ගොස් දිය පතක් දේවියගේ ඇඟට ඉස විෂ රහිත කරන්න" යයි කීයේය.

රජතුමා අර ප්‍රවෘත්තිය අසා වධයට නියම වූ පුරුෂයා කැඳවා දේවියගේ විෂ බැස්සීමට නියම කෙළේය. ඔහුත් නා රජු කියූ පරිදි දිය පතක් ගෙන දේවියගේ ඇඟට ඉස විෂ නැති කෙළේය. රජතුමා එය දැක ඉතා සතුටුව ඔහුට කුඹුරු, වතු, යාන වාහන දී සත්කාර කෙළේය. ඔහු පසුව කැලෑවෙහි නරා වළෙහි වැටී සිටි තැන සිට සියලු විස්තර රජතුමාට කීයේය.

රජතුමා ඒ ප්‍රවෘත්තිය අසා අතිශයින් පැහැදී ඔහුට විශාල මන්දිරයක් කිරීමට නියෝග කෙළේය. ඔහු තමන්ට තනන එම ගෙය නුග ගසටත්, හුඹසටත් අතර කරන්නට යයි කීයේය. එසේ කොට රජුට ද උපස්ථාන කරමින් මිතුරන් දෙදෙනා සමඟ ද සතුටුව වාසය කෙළේය.

## 4. බුද්ධෙනියගේ කථාව

දඹදිව පාටලි පුත්‍ර නගරයෙහි අසූහත් කෝටියක් ධනය ඇති එක් සිටු ගෙදරක් විය. මේ සිටාණන්ට එකම දුවක් වූවාය. ඇයගේ නම බුද්ධෙනි ය. ඇයට සත් අවුරුදු කලැ දෙමව්පියෝ පරලෝසැපත් වූහ. මුළු බූදලය බුද්ධෙනියට අයත් විය. ඕ ඉතා රූමත්ය. දෙවඟණක් හා සමය. තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්ය. එම නගරයෙහි සිටුවරු සෙන්පතිවරු යුවරජවරු මැය කැමැත්තෙන් තෑගි බෝග සහිත මංගල යෝජනා යැවූහ. ඕ මේ යෝජනා අසා මෙසේ සිතුවාය. මගේ දෙමාපියෝ මේ සියලු වස්තුව අත්හැර ගියහ. හිමි කුලයකට යෑම මේ සම්පත් විනාශ කරගන්නකි. මා විසින් මේ ධනය බුදු සසුන්හි නිදන් කළ යුතුය. මෙසේ සිතා විවාහ යෝජනා ප්‍රතික්ෂෙප කොට එතැන් පටන් මහ දන් දුන්නීය. මෙසේ ඕ තොමෝ මැනැවින් දුන් දුන්නාය.

පසු කලෙක එක් අස් වෙළෙන්දෙක් නැගෙනහිර සිට බස්නාහිරට අසුන් වෙළෙඳමෙහි පැමිණ මැයගේ නිවසෙහි නවාතැන් ගත්තේය. ඒ වෙළෙන්ද බුද්ධෙනිය දැක දුහිතෘ ස්නේහය උපදවා ඇයට නොයෙක් වස්තු පරිත්‍යාග කෙළේය. ආපසු යන වේලාවෙහි තමන් සතුටු අශ්වයකු ගන්නට යයි ඇයට කීවේය. ඕතොමෝ ශෛන්ධව අශ්ව පෝතකයකු පෙන්වා ඌ ඉල්ලුවාය. වෙළෙන්ද ඒ අසු පැටියා දී හොඳින් ආරක්ෂා කරන්න යයි කීවේය. මේ අසුපැටියාට අහස් ගමන් හැකි බව පසුව ඕ දැන ගත්තාය. පින් කිරීමට මට යහළුවෙක් ලැබිණ. මීට පෙර නොගිය සිරිමහ බෝධිය වැඳිය හැකිය. මෙසේ කල්පනාකොට බොහෝ රන්මාලාදිය රැගෙන අශ්වයා පිට නැගී අහසින් ගොස් බෝධි පූජාවට ආයුෂ්‍යන් වහන්සේලාටත් සහභාගි වන සේ ආරාධනා කළාය. සිංහල දිවයිනෙහි රහත් භික්ෂූහු මේ ආරාධනාව පිළිගෙන සිරිමහ බෝමැඩට ගොස් එම පූජාවන්ට සහභාගි වූහ. මෙතැන් පටන් ඕ තොමෝ නිතර නිතර බෝමැඩට ගොස් මෙසේ පූජා පැවැත්වූවාය. මෙසේ නිතර ගමන් කරන ඇය දුටු වැදි මිනිස්සු පැළලුප් නුවර රජුට මේ ප්‍රවෘත්තිය කීවාහුය. ඔබතුමාට යෝග්‍ය කුමාරිකාවක් බව ද පැවැසුවාය. රජතුමා ඇය අල්ලාගෙන එන සේ ඔවුනට නියෝග කෙළේය. මිනිස්සු සැහැවී උන්නාහුය.

කුමාරිතොමෝ එදා ද අසු පිටින් පැමිණ රහතන් වහන්සේ සමඟ බෝධි පූජාව කළාය. ධම්මරක්ඛිත තෙරනුවෝ ඇයට මේ කරදරය ගැන කියා පරිස්සම් වන සේත්, කරදරයක් වුවොත් තුන් සරණය සිහි කරන සේත් අවවාද කළෝය. මිනිස්සු කුමරිය දැක අල්ලා ගැනීමට සූදනම් වූහ. ඕ තොමෝ අසුට විළුඹින් සනිටුහන් කළාය. අශ්වයා ඉතා වේගයෙන් අහසට පැන්නේය. අසුගේ වේගය ඉවසන්නට බැරි වූ කුමාරිකා තොමෝ අසු පිටින් ගිලිහෙන්නී පුතා, කළ උපකාරය සිහි කරන්න යයි කීවාය. අසු වහාම ආපසු පහතින් ගොස් කුමරිය තම පිට උඩ තබා ගෙන සිය නිවසට ගෙන ගියේය. මෙසේ බුද්ධෙනිය මුළු බූදලයම බුදු සසුනට වියදම් කොට පින් එකතු කොට මිය දෙව්ලොව උපන්නීය.

## 5. අභිගුණ්ඨික කථාව

කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසා බුද්ධ කෘත්‍යය කොට සෙතව්‍ය නුවරදී පිරිනිවන් පෑ සේක. මිනිස්සු උන්වහන්සේගේ ධාතු නිදන් කොට කෝටි ගණනක් වියදම් කොට චෛත්‍යයක් බැඳවූහ. මේ අතර එක් අභිගුණ්ඨිකයෙක් ගම් නියම්ගම් දනව්වල හැසිර නයි නටවා ජීවත් විය. සෙතව්‍යා නුවර මිනිස්සු බෞද්ධයෝය. රාත්‍රියට නින්දට යන්නේ "නමෝ බුද්ධාය" යන්න සිහි කොටය. අභිගුණ්ඨිකයා බුදු ගුණ නොදනී. මේ නමෝ බුද්ධාය යන්න උපහාසයක් කොට කියන්නේය.

මෙසේ එක් දිනක් ක්‍රීඩා කරවීමට සුදුසු නයකු සොයමින් හේ ඇවිදී. එක් නාගරාජයෙක් කාශ්‍යප බුදුරජුන්ගේ චෛත්‍යයට වැඳ හුඹසකට යන අතර මොහු දැක මන්ත්‍ර ජපකර අල්ලා ගැනීමට සූදනම් විය. නාගයා ඔහුගේ මන්ත්‍ර ජප කිරීම අසා කිපී ඔහු පසු එළවීය. හැකිතාක් වේගයෙන් දිව පණ බේරා ගන්නට සූදානම් වූ නමුත් ගලක පය වැදී ඇදවැටුණි. ඔහුට පුරුදුව තුබූ "නමො බුද්ධාය" යන්න එහිදී කියවිණ. නාගයා එයින් තෘප්තියට පැමිණ දෂ්ට නොකොට, පැහැදී රන් මල් තුනක් තෑගි වශයෙන් දුන්නේය. මෙයින් එක මලක් මට පින් පිණිසත්, එකක් ඔබට පින් පිණිසත් පූජා කරවයි කීය. තුන්වැන්න වැය කොට අඹුදරුවන් පෝෂණය කරන්න යයි කීයේය.

මේ කී අයුරු චෛත්‍යයට රන්මල් දෙකක් පුද එකක් විකුණා කහවනු දහසක් ලැබ දන් පින් කරමින් කාලය ගත කොට කම් වූ පරිදි මිය පරලොව ගියේය.

## 6. සරණ තෙරුන්ගේ කථාව

සැවැත් නුවර සුමන නම් ගෘහපතියෙක් විය. ඔහුගේ භාර්යාව සුජම්පතිකා නම් වූ, මේ දෙදෙනට දුවක් හා පුතෙක් ලැබිණ. ඔවුන් කුඩා කල්හිම දෙමාපියෝ කළුරිය කරන්නෝ වැඩිමහලු පුත්‍රයා කැඳවා 'දරුව, ඔබ සුදුසු තැනක යෙදවීමට නොහැකි වූයෙමු. අප අයත් සියලු ධනය ගන්න. මේ නැඟණියගේ ද දියුණුව සලස්වන්න' යැයි වැඩිමහලු පුතාගේ අත බාල දියණියගේ අත මත තබා ඔවුහු කළුරිය කළෝය. මවුපියන්ගේ

ආදහන කෘත්‍යය කොට නැගණිය සුදුසු කුලයකට සම්බන්ධ කොට තමා ද විවාහ වී විසුවේය.

කල්යාමෙන් ඔහුගේ නැගණිය ගැබ්ගෙන සැමියාට කියා සොහොයුරාගේ ගෙදරට පැමිණියේය. මේ අතර භික්ෂු සංඝයා පිරිවරා වැඩම කළ බුදුරජාණන් වහන්සේ දැක පහන් සිත් ඇතිව නමස්කාර කොට එකත් පසක සිටියෝය. උන්වහන්සේ ඒ දෙදෙනාගේ වාසනා සම්පත් දැක සරණ සිල්හි පිහිටවූ සේක. මෙසේ ද දේශනා කළහ. කිසි අවස්ථාවක කරදරයක් වුවොත් බුදුරජාණන් වහන්සේ සිහි කරන්න කියා බුදුන් වැඳ ඔවුහු ගමන් කළෝය. වැඩිමහල් සොහොයුරා මෙසේ පැමිණි මේ දෙදෙනා දැක සුදුසු සේ සැලකීය. සැමියා ටික දිනක් වාසය කොට කටයුත්තක් ඇත කියා නංගී අයියාට බාරදී ගියේය. හෙතෙම සිය බිරිය කැඳවා ඇයට සලකන්නට යයි නියම කෙළේය. කියූ පරිදි උපස්ථාන කරන ඇයට මේ තැනැත්තියගේ ආභරණ ගැන ආසා සිතී කැම වර්ජනය කොට කාමරයක් තුළට වී විසුවාය. සැමියා මෙයට හේතු විචාළේය. නමුත් ඕ අදහස සැඟවූවාය. පසුව සැමියාගේ බලවත් පෙරත්තය නිසා අදහස වෙනස් කොට ඔබගේ සොහොයුරියගේ පංචමාංග අනුභව කිරීමට මට ආසාවක් ඇති විය. ඒ ආසාව ඉටු කිරීමට බැරි නම් මම මරණයට පත්වෙමියි තරයේ ඕ කීවාය. ඔහු මරණයේ වැරැද්ද පෙන්විය. නමුත් ඕ තමා ගත් අදහසේ තරව සිටියාය.

ඇගේ සැමියා සිය සොහොයුරිය මැරීමට තීරණය කොට වෙනම උපායක් යොදා දෙමාපියන්ට අයත් ණයකරුවන් හමුවීමට යමු යයි යෝජනා කොට සැප පහසු වාහනයක නංගී නංවාගෙන කැලෑවට ගියේය. රිය පාර සමීපයේ නවතා ඇයගේ හිසකේ අල්ලා බිම පෙරළීය. මේ අවස්ථාවේ ඇයට කර්මජාවත සෙළවිණ. ඒ බැව් සොහොයුරාට කියා ඔහු ඉවත් කිරීමට මහන්සි ගත්තාය. නමුත් සඵල නොවීය. මෙසේ පහර දෙද්දීම ඇයට දරුවා ලැබිණ. නැගණිය, බෑණා දෙස බලා නොමරන මෙන් ඉල්ලුවාය. නමුත් ඒ නර රකුසා නැගණිය ඒ අසල වූ නුගරුක යටට ගෙන ගොස් මරන්නට තැත් කළේය. මුලදී ඇය විලාප නැංවූවාය. එහෙත් විලාප හඬින් කිසිවෙක් පැමිණියහොත් එය සොහොයුරාට අයහපතට හේතු යයි සලකා මෛත්‍රී කෙළේය. බුදු සරණ ගැනම සිතීය.

නුගරුක් දෙවියා මේ අපරාධය දක නංගිගේ ස්වාමියා සේ එතැනට පැමිණ තර්ජන ගර්ජන කොට ඔහු එළවීය. පසුව ඇයවත්, දරුවාත් වාහනයක නංවා සැවැත් නුවරට ගෙන ගොස් නගරයෙහි වූ ආගන්තුක ශාලාවෙහි නතර කොට ගියේය. ඇගේ සැමියා ඇය එතැනට පැමිණ, කවුරුන් සමඟ පැමිණියේදැයි විමසී. ඔබත් සමඟ යයි ඕ කීවාය. පසුව සොහොයුරා කළ බලහත්කාරකම ස්වාමියාට කීවාය. දින කීපයකට පසු බුදුරජාණන් වහන්සේට දන් සරසා වැඩම කරවා දන් දී ජීවිතය ලැබුණු අයුරු විස්තර කළෝය. තමන්ගේ දරුවාට සරණ යන නම තැබූහ. ධම් දේශනාව අසා දෙදෙනාම සෝවාන් වූහ. සරණ කුමාරයා විසි වයසේදී විදසුන් වඩා සරණ හිමි යයි ප්‍රසිද්ධ විය.

## 7. වෙසසා මිත්තාවගේ කථාව

දඹදිව කොසඹෑ නුවර කොසඹෑ රජතුමාගේ අග බිසව වෙස්සාමිත්තාය. බුදුරජාණන් වහන්සේ ද කොසඹෑ නුවර මෙසමයෙහි විසූ සේක. වෙස්සාමිත්තාවෝ රජතුමා සමඟ විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේගේ බුධ ලීලාව දැක පැහැදී සරණ සිල්හි පිහිටියාය. පසු කාලයක පිටිසර බද රජෙක් රජුට විරුද්ධව පැමිණ රාජ්‍යය හෝ යුද්ධය කියා සන්දේශයක් එවා තිබුණි. මෙයැසූ රජතුමා සේනාව පිරිවරාගෙන මෙහෙසියත් සමඟ යුද බිමට ගොස් ඇයට මෙසේ කීයේය. 'දේවීනි, යුද්ධය ගැන කීමට අපහසුය. මා යම් විධියකින් පරදින බව පෙනී ගියොත් කඳවුරෙහි රතු කොඩියක් ඔසවමි. ඒ සලකුණෙන් ඔබට කොසඹෑ නුවරට යා ගැනීමට හැකි වන්නේය.' රජතුමාට යුද්ධයෙන් පරාජය පෙනෙනු බැවින් දේවියට දැන ගැනීමට කඳවුරෙහි රතු කොඩියක් ඔසවා යුද කොට පරාජයට පත්විය. දේවිය සලකුණෙන් පරාජය දැන කොසඹෑ නුවරට යන අතර පසල් දනව් රජුගේ ආරක්ෂකයන්ට අසුවී ඔවුහු ඇය රජුට ඉදිරිපත් කොළෝය. රජතුමා ඇයට තමන්ගේ අග බිසොව වන්න යයි ආරාධනා කළේය. ඕ එය ප්‍රතික්ෂේප කළා. නැවත නැවතත් අග බිසෝ වීම ප්‍රතික්ෂේප කළ නිසා රාජාඞ්ගනයෙහි දර සෑයක් කරවා එයට ගිනි දී ගින්නට පනින මෙන් ඇයට නියෝග කළේය. ඕ නොයෙක් යුක්ති කියමින් එයින් ගැලවීමට උත්සාහ කළත් කිසි ප්‍රයෝජනයක්

නොවීය. පසුව දැල්වෙන ගින්නට බලහත්කාරයෙන් ඇය දැම්ම වීය. මේ මොහොතේ ඇය බුදුරජුන් සරණය ගැන උස් හඬින් කියා සිටියාය. පුදුමයකි! ඒ ගිනි දැල් ඇගේ ලෝම කූපයක් දැවීමට අසමත් විය. මේ පුදුමය දුටු රජතුමා වහා පැන ඔසවාගෙනවිත් ආසනයක තබා ඇඳිලි බැඳ ගෙන මේ නොදැවීමට හේතු විචාළේය. බිසව් තොමෝ තමා බුදුන්, දහම්, සඟුන් සරණ ගිය උපාසිකාවක් බවත්, ඒ බෙලෙන් නොදැවී ගිය බවත් ප්‍රකාශ කළාය. ඇගේ මේ බණ කථාව අසා අතිශයින් සතුටට පත්ව ඇය මව් තනතුරෙහි තබා ගත්තේය. රජතුමාත්, බොහෝ සේනාවත් මෙහිදී තුනුරුවන් සරණ ගියෝය.

## 8. මහාමන්ධාතු කථාව

විපස්සී සම්බුදු රජුන්ගේ කාලයෙහි බන්ධුමතී නුවර මන්ධාතු රජතුමා සන්නාලියෙක්ව ඉපදුනේය. බන්ධුමතී නගරවාසීහු බුදුපාමොක් මහ සඟනට මහ දන් පැවැත්වූහ. සන්නාලියාට පමණක් මේ දන්වැටට සහභාගී වීමට තමන්ගේ දුප්පත් ජීවිතය නිසා අපොහොසත් විය. කෙසේ හෝ සුළු මුදලක් උපයාගත් මොහු කඩයෙන් මෑ ඇට ගෙනවිත් එය තම්බාගෙන දන් ශාලාවට ගියමුත් එක පාත්‍රයකටවත් මෙය බෙදීමට ක්‍රමයක් නැත. හෙතෙම බලවත් ශ්‍රද්ධාවෙන් තමන් ගෙන ආ මෑ ඇට, පාත්‍ර තබා තුබූ තැනට විසි කළේය. බුදුරදුන්ගේ හා දෙවියන්ගේ අධිෂ්ඨානය අනුව එම මෑ ඇට සියල්ලම බුදු රජුන්ගේ පාත්‍රයේ සිට සෑම පාත්‍රයකටම වැටිණ. ඔහුට නිම්හිම් නැති සතුටක් ඇතිවිය. එහිදී මෙබඳු පැතීමක් කළේය. මේ පින්කමේ අනුසසින් සසරෙහිදී පස්කම් සැප විඳින්නන්ගෙන් අග්‍ර වෙමි. අප්පුඩි ගසා අහස දෙස බැලූ විට අහසින් සත්රුවන් වැසි වැසිය යුතුය.

ඔහු සසරෙහි සැරිසරා මහත් දෙව් සැපත් වින්දේය. පිළිවෙළින් රජ පරපුරේ මන්ධාතු යයි උපන් ඔහු සක්විති රජකම් ලැබ රාජ්‍යය කරවයි. පැතූ සේම සත්රුවන් වැසි වැස්සේය. අසූහාර දහසක් අවුරුදු කුමාර සැපද, අසූහාර දහසක් අවුරුදු යුවරජ සැපද, අසූහාර දහසක් අවුරුදු සක්විති රජ සැපත් වින්දේය. පසුව සක්විති රජකමට උකටලිව සක්රුවනට පැන් වඩා චාතුම්මහාරාජික දෙව්ලොවට ගොස් සතරවරම් රජදරුවන්

විසින් රාජ්‍යයෙන් පිදූ එහි දෙව් සැපත් පිරිවරත් සමඟ විඳ, ඒ කම් සැපෙනුත් තෘප්තිමත් නොවී තව්තිසා දෙව්ලොවට පිරිවර සමඟ ගියේය. ශක්‍රයා තමන්ගේ රාජ්‍යය දෙකට බෙදා වස්තුව කොටසක් බාර දුන්නේය. බොහෝ ගණනක් අවුරුදු එහි සක්දෙව් රජ සැප වින්දේය. ශක්‍රයන් 36 දෙනකු ඉපිද, මැරෙනතුරුම මන්ධාතු ශක්‍ර සම්පත්ති විඳ කොටසක් පමණක් මදි යයි සිතා ශක්‍රයා මැරීමට තීරණය කළේය. ශක්‍රයා ද පින් ඇති කෙනෙකි. ඔහු මැරීමට බැරිය. මේ හේතුවෙන් මන්ධාතු සක් සැපතින් ගිලිහී තමන්ගේ රාජ්‍යයේ උද්‍යානයට පිරිසත් සමඟ පිවිසියෝය. උයන් පල්ලා රජුට දන්වා ආසනයක් පනවා දුනි. ඔහු එහිදීම මළේය. ලෝකයාට ඔබ දෙන පණිවිඩය කුමක්දැයි ඇසූ අයට මෙසේ කීයේය. "මන්ධාතු දෙදහසක් කොදෙව් සහිත සතර මහාද්වීපයෙහි සක්විතිවත් චාතුම්මහාරාජික දෙව් ලොවත් තව්සිතාවෙත් ශක්‍ර රාජ්‍යය පාලනය කළේය. 36 දෙනෙක් ශක්‍රයන් මියයන තෙක් එහි ශක්‍ර දේවත්වය ඉසිලීය." මෙසේ කියා පරලොව ගියේය.

## 9. බුද්ධවම්ම වෙළෙන්දගේ කථාව

දඹදිව පාටලී පුත්‍ර නගරයෙහි බුද්ධවම්ම නම් වෙළෙන්දෙක් විය. ගැල්සාත්තුවක් සමඟ වෙළෙඳාම් කරමින් ඇවිදී. මේ සමයෙහි බුදුරජාණන් වහන්සේ චාරිකාවෙහි වඩිමින් සිටියහ. මේ වෙළෙන්දට මුන්වහන්සේ සවස් කාලයක හමුවිය. උන්වහන්සේට වැඩ සවස් කාලයෙහි දනය සඳහා ආරාධනා කළේය. මේ නොකල් බව කියා සිටි විට සුදුසු අටවැදෑරුම් පාන වර්ග ගැන දැන්වූයෙන් මිදි යුෂ ගිලන් පසක් සේ පිළියෙළ කොට පිළිගැන්වීය. උන්වහන්සේ භික්ෂූන් සමඟ මේ මිදි පැන් වළඳ අනුමෝදනා කොට චාරිකාවෙහි ගියහ. වෙළෙන්ද ද පිරිස සමඟ වෙළෙඳාමෙහි ගියෝය. ඔහු මහාවත්තනිය නම් දිය නැති කාන්තාරයට පිවිසියේය. මොහුගේ ගැල්වල තිබූ පැන් තිමාවට ගොස් තිබිණ. අර වෙළෙන්ද හැම ගැලක පැන් සොයා නොලැබී වෙහෙසට පත්විය. පසුව එක් ගැලෙක කම්කරුවෙක් පැන් ඉතා ටිකක් ඇතැයි කීයෙන් ඔහුම එය විවෘත කොට පානය කළේය. එම පැන් මිදි රසයෙන් යුක්තය. සියලු දෙනාම මිදි පැන් බීවෝය. බුදුරජුන්ට දුන් දනයේ

ආනිසංසය ලැබී යයි අතිශයින් සියල්ලෝම තුටු වූහ. ආපසු නගරයට පැමිණ බුද්ධවම්ම වෙළෙන්ද විහාරයට ගොස් සිදුවුණු ප්‍රාතිහාර්‍ය්‍ය විස්තර කළේය. ඊට පසු දින මහදන් පිළියෙළ කොට බුදුපාමොක් මහසඟනට පූජා කළේය. මෙසේ නිතර නිතර දන් දුන් මේ වෙළෙන්ද මියගොස් දෙව්ලොව දෙළොස් යොදුන් රන්විමනක ඉපදුණේය. ඔහුගේ පින්කම ප්‍රකාශ වෙන පිරුණු මිදි පැන් රන් බඳුන්වල තිබිණි. දෙවියෝ මේ පැන් බී නටති, ගයති, වයති.

## 10. රූප දේවියගේ කථාව

විපස්සී බුදුරජුන්ගේ කාලයෙහි බන්ධුමතී නගරයෙහි රමණීය වූ විහාරයෙහි උන්වහන්සේ වාසය කළ සේක. එක් ගම් දැරියක් විහාරයෙහි ඇවිද ගිලන් වූ භික්ෂූන් වහන්සේ නමක් දැක අනුකම්පා කොට අසනීපය ගැන බෙහෙත් කැඳක් පිළියෙළ කරන බවත්, හෙට තමන්ගේ ගෙදරට වඩින ලෙසත් ආරාධනා කළාය. ඕ ගෙදර ගොස් දෙමාපියන්ට ද කියා නොයෙක් ඖෂධ වර්ග බහා බෙහෙත් කැඳක් ද, ආහාර ද පිළියෙළ කළාය. එකී භික්ෂූන් වහන්සේ ගෙදරට පැමිණි විට බෙහෙත් කැඳ හා ආහාර පිළිගැන්නුවාය. බෙහෙත් කැඳ වැළඳීමත් සමඟ භික්ෂුවගේ රෝගය සන්සිඳිණ. ඊට පසු දින ද එසේම පිළියෙළ කළත් භික්ෂූන් වහන්සේ නොවැඩි සේක. ගම්දැරිය විහාරයට ගොස් බෙහෙත් දින කීපයක් වැළඳිය යුතු බව කී විට එම බෙහෙත් කැඳින් රෝගය සන්සිඳුණු බව ප්‍රීතියෙන් කීහ. ඕ අතිශයින් සන්තෝෂයට පත්වූවා පසු කල කළුරිය කොට දෙව් ලොව උපන්නීය. බුධාන්තර 6 ක් යනතුරුම ඕ දෙව් සැපත් වින්දය. අපේ සම්බුදුන්ගේ කාලයෙහි ධනවත් බමුණු කුලයක ඉපදුණාය. ඈ උපන්ද සිට එම ගෙදරට නැළි අටක සහල් ලැබේ. ඇගේ රූප සම්පත් දුටු දෙමාපියෝ 'රූප දේවී' යයි නම් තැබූහ.

ඕ සාල් නැළියක් ගෙන පිසන්නට පටන් ගත් විට තමන් කැමැති මස් මාළු එළවළුත්, ගිතෙල් වෙඬරු කිරි ආදියත්, දුරු මිරිසුත්, කෙසෙල්, වරක ආදී පළතුරුත් භාජන පුරවා ඇත. ඈ අතින් ගත් කිසි ආහාරයක් නරක් නොවේ. මුළු නුවර වැස්සන්ටම මේ ආහාර දෙන්නීය. එහෙත් නිමාවකට නොයයි. පන්සියයක්

භික්‍ෂූන් වහන්සේ ඇගේ ගෙදර නිතිපතා වළඳති. පිළිසිඹියාපත් මහා සංඝරක්ඛිත හිමියෝ ඇගේ පෙර කර්මය දන්නේ දැයි දිනක් විමසූහ. ඕ එය නොදන්නා බවත්, කරුණාකොට ප්‍රකාශ කරන ලෙසත් ඉල්ලා සිටියාය. උන්වහන්සේ ඇයට පෙර රෝගාතුර භික්‍ෂුවකට කළ පින්කම ප්‍රකාශ කළ සේක. දැනුත් පින්කම් කිරීමට පමා නොවන්නට බණ කී සේක. පසුව නිතර නිතර පින්කම් කොට සෝවාන් වූ ආර්ය ශ්‍රාවිකාවක් වූවාය.

දහම් සොඬවග නිමි.